# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,795—1959 ජූලි 1 වැනි බදාදා—1.7.1959**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම්

**1959—අංක 280**

අ. ආ. කා. අංකය : C 218/56 (iii).

1946යේ හා 1947තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජ සභා නියෝගවල 47 වැනි වගන්තිය යටතේ, ඩබ්ලිව්. ජී. ඇම්. ඇල්බට් සිල්වා මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී, රජයේ වැඩ පිළිබඳ ගරු ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම් වශයෙන්, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පත් කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1959 ජූලි 1 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය.

---

## මිළ පාලන දැන්වීම්

**අංක 27 දරණ ආහාර මිළ නියෝගය** **සහල්**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිළ පාලක තැන්පත් තම්බයියා සිවඥනම් වන මම, 3 (2) වගන්තිය හා කියවෙන 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(i) 1959 ජනවාරි මස 12 වන දින අංක 11,639 දරණ ලංකාණ්ඩුවේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරනලද අංක එච්. 25 හා 1959 ජනවාරි 6 වන දින දරණ මිළ නියෝගය 1959 ජූනි 15 වන දින සිට අවලංගු කරමි.

(ii) 1959 ජූනි 15 වනදා සිට මීට යාකර ඇති උපලේඛනයේ 2 වන හා 3 වන තීරයේ දක්වෙන මිළ එම උපලේඛනයේම 1 වන තීරයේ දක්වෙන පෙදෙස්වල සහල් සිල්ලරට ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ වන අතර, ඒ මිළට වඩා ඒ පෙදෙස්වල නොවිකිණිය යුතු බව නියෝග කරමි.

(iii) වෙන ද්‍රව්‍යයන් සමග මිශ්‍ර කිරීමෙන් බාල කරන ලද සහල් කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියෝග කරමි.

(iv) සහල් විකිණීමේදී එම සහල් යම් දෙයක ඔතනු හෝ අසුරනු හෝ ඇතිනම් එහි මිළද මේ නියෝගයෙන් සහල්වලට නියමකරන ලද වැඩිම මිළ බවද නියමකරමි.

(v) තවද, මෙම නියෝගයේ කාර්‍ය සඳහා—

" රාත්තල " හෙවත් " රා. " යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බරය.

1959 ජූනි මස 27 වන දින පෙරවරු 10 ට හම්බන්තොටදී අත්සන්කරන ලදී.

ටී. සිවඥනම්,
නියෝජ්‍ය ආහාර මිළ පාලක තැන,
පරිපාලන දිස්ත්‍රික්කය, හම්බන්තොට.


1861—ජේ. ඇන්. ආර් 2688 —4,225 (6/59)

## උප ලේඛනය

| | ප්‍රදේශය | හම්බන්තොට දිස්ත්‍රික්කයේ නීත්‍යානුකූල හාල් සළාකයේ පළමුවන සහ දෙවන රාත්තල් සඳහා රාත්තලක වැඩිම සිල්ලර මිළ | | හම්බන්තොට දිස්ත්‍රික්කයේ සීමාවතුළ නීත්‍යානුකූල හාල් සළාකයේ තුන්වන සහ හතරවන රාත්තල් සඳහා රාත්තලක වැඩිම සිල්ලර මිළ |
|---|---|---|---|---|
| | | ශත | | ශත |
| 1. | රැකව, තංගල්ල, උනාකුරුව, වල්ගම්එළිය, මාරකොල්ලිය, තේනගම, කදුරුපොකුණ පොළොන්මාරුව, සිටිනාමළුව, වගේගොඩ, බෙලිඅත්ත, ගොඩවෙල, කහවත්ත, පුවක්දණ්ඩාව, දම්මුල්ල, ඉහළබෙලිගල්ල, පහළබෙලිගල්ල, පල්ලත්තර, පට්ටියවෙල, සියඹලාගොඩ, වහරක්ගොඩ, නාරපේරිය, ගැටමාන්න උතුර, ගැටමාන්න දකුණ, කුඩා හිල්ල, මහහිල්ල සහ පලපොත යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... ... ... ... | 14 | ... | 24 |
| 2. | බෝවල, ගලහිටිය, හොරවෙල, ඉත්තදෙමළිය, කඩිගමුව, තලහගම්වාඩුව, වලස්මුල්ල, දළුවක්ගොඩ, කණුමුල්දෙනිය නැගෙණහිර, කණුමුල්දෙනිය දකුණ, කණුමුල්දෙනිය බටහිර, මොදරවාන, වාච්ච, යටිගල, කුඩාවැල්ල නැගෙණහිර, කුඩාවැල්ල බටහිර, සීනිමෝදර, නාකුළුගමුව බටහිර, නාකුළුගමුව නැගෙණහිර, දෙද්දුවාවල, අම්බල සහ ගලගම යන ගම්මුලාදෑනි කොට්ඨාශ | 14¼ | ... | 24¼ |
| 3. | බැදිගම, බුද්දියාගම; ගෝන්දෙනිය, මන්ඩාඩුව, මූකිරිගල, යක්ගස්මුල්ල, කිංචිගුනේ, හීල්ලගෙ අයින, වල්ගම්මුල්ල, වෙළඳගොඩ, රදනිආර, බැකැන්දයාය, හොරවින්න, ජූලම්පිටිය, ගහලන්දෙනිය, කටුවන, රැක්මල්පිටිය, සියාරපිටිය, තල්වත්ත, සහ උඩගොමඩිය යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... ... ... ... ... | 14½ | ... | 24½ |
| 4. | හඳුගල, වරාපිටිය, පාතෙගම සහ පිහලැල්ල යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... ... | 15¼ | ... | 25¼ |
| 5. | මිද්දෙනිය, හල්ලල, සපුගහයාය, ලබුහේන්ගොඩ, මෙල්ලකැටිගොඩ, මුරුන්ගස්යාය, වැලිපිටිය, කුඩාගල්ආර, කුඩාගොඩ, තලාව, දෙබොක්කාව, දබරැල්ල සහ ඔකන්දෙයාය, යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... ... ... ... | 14¼ | ... | 24¼ |
| 6. | අබේසේකරගම, උස්වැව. සහ සියඹලාකොටේ යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... ... | 14½ | ... | 24½ |
| 7. | වැලිපටන්විල, මිණිඇතිලිය, මාමඩල, නවාලුවිල, ලුනම, බැමිණියන්විල, හාතගල, වාඳුරුප්ප, බෝලාන, බැරගම, වලවෙ, ඇත්බටුව, බටඅත, පල්ලෙගම, අඟුණුකොළපැලැස්ස, මුලන සහ කොග්ගල්ල යන ගම්මුලාදෑනි කොට්ඨාශ... ... ... ... | 14½ | ... | 24½ |
| 8. | හම්බන්තොට නගර සභා කොට්ඨාශය ... ... ... ... | 14½ | ... | 24½ |
| 9. | බුන්දල, ගොන්නෝරුව, කොහොලන්කල, ඉහළ කුඹුක්වැව සහ වැලිවැව යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... ... ... ... ... | 15 | ... | 25 |
| 10. | රණකෙළිය දකුණ, රණකෙළිය උතුර, උඩුවිල, තිස්ස උතුර, තිස්ස දකුණ සහ වීරවිල යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... ... ... ... ... | 15 | ... | 25 |
| 11. | මත්තල සහ අඟුණකොළවැව යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... ... ... | 15½ | ... | 25½ |
| 12. | කිරින්ද සහ මාගම යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... ... ... | 14¾ | ... | 24¾ |
| 13. | ජුල්මුල්ල, පට්ටියපොල, උඩයාල, හින්බුන්න, දහඅමුණ, හකුරුවෙල, මැදගොඩ, විතාරන්දෙනිය සහ වකමුල්ල යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... ... ... | 15¼ | ... | 25¼ |
| 14. | ගුරුපොකුණ, නෙටොල්පිටිය, විගමුව සහ කහඳාමෝදර යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... | 14½ | ... | 24½ |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් සහල් විකිණීමේ නියමිත මිළ නොවේ. මේ එම සහල් විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහළින් සහල් විකිණිය නොහැකිය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී